**<u>දොම්පෙ ප්‍රාදේශීය සභාව</u>**
**<u>ගම්පහ දිස්ත්‍රික්කය</u>**

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 29 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට දොම්පෙ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**.

1.3.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී ඇති ගණකාධිකරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඔප්පු අංක 17143 දරන වැකේ වත්ත හෙවත් මාලිගාවත්ත පර්චස් 13.44 ක් වූ ඉඩමෙහි වටිනාකම වූ රු.2,000,000 ක් ගිණුම්වලට සහ ස්ථාවර වත්කම් ලේඛනයට රු.200,000 ක් ලෙස ඇතුළත් කර තිබුණි.

1.3.2 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

(අ) ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාගෙන ඇති රු.2,897,764 ක් වූ ණය ශේෂයට අදාළ ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) මහජන බැංකුවේ 2015 ජනවාරි 01 දිනට රු.7,127,650 ක් වටිනා ස්ථාවර තැන්පතු සම්බන්ධයෙන් 2015 දෙසැම්බර් 31 දිනට පොලී ආදායම, පොලී ප්‍රතිශතය, රඳවා ගැනීමේ බදු මුදල ආදී විස්තර ඇතුළත් බැංකු ප්‍රකාශයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය පමණක් ගෙන්වා ගෙන ගිණුම් ගතකර තිබුණි.

2. **<u>මූල්‍ය සමාලෝචනය.</u>**

2.1 **<u>මූල්‍ය ප්‍රතිඵලය</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.89,727,106 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.40,395,817 ක් විය.

2.2 **<u>මූල්‍ය පාලනය</u>**

(අ) 2015 දෙසැම්බර් 31 දිනට දොම්පෙ උප කාර්යාලයේ රැස්කිරීමේ ගිණුමේ ශේෂය රු.3,332,126 ක් වූ අතර, 2015 මැයි මස සිට මෙම ගිණුමේ මුදල් ප්‍රධාන කාර්යාලයේ ගිණුමට මාරු

නොකිරීම මත සහා අරමුදල් ආර්ථික හා ඵලදායිව යොදා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) තත් කාර්යයන් 6 ක් සඳහා ගෙවා තිබූ රු.453,056 ක් පියවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371 අනුව ක්‍රියාකර නොතිබුණි. මින් කාර්යයන් 2 කට ලබාගත් රු.150,556 ක් වූ අත්තිකාරම් මුදල් වසර 07 සිට වසර 10 දක්වා කාලයක් ගතවී ඇතත් පියවීමට කටයුතු කර නොතිබුණි. ඉතිරි රු.302,500 ක් වූ අත්තිකාරම් මුදල් පියවීමේ කාල ප්‍රමාදය මාස 1 ½ සිට මාස 9 දක්වා විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

ලේකම්වරිය විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 6,111 | 7,193 | 2,913 |
| බදු කුලී | 7,300 | 7,583 | 280 |
| වෙළඳ බලපත්‍ර | 1,195 | 1,158 | 37 |

2.3.2 කඩකුලී

(අ) කිරිදිවැල නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 3 ට අදාළව 2011 වසරේ සිට පැවත එන 2015 දෙසැම්බර් 31 දිනට රු.2,809,715 ක් වූ පෙර ගෙවුම් ශේෂයෙන් 2016 අප්‍රේල් 07 දින වන විට රු.1,214,945 ක මුදලක් අයකර ගෙන තිබූ අතර, තවදුරටත් අයවියයුතු ශේෂය රු.1,594,770 ක් විය.

(ආ) පූගොඩ එළහරක් මස් වෙළඳසැල සහ සතිපොළ ටෙන්ඩර් කිරීමේදී ගිවිසුම ප්‍රකාරව ජල හා විදුලිය සඳහා රු.25,000 බැගින් ආරක්ෂිත ඇප මුදලක් තැන්පත් කළ යුතු වුවත් එම මුදල් තැන්පත් කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

කිරිදිවැල පොදු වෙළඳ පොළ අංක 23 කඩ කාමරය 2014 අප්‍රේල් මස සිට වසා ඇති අතර 2015 දෙසැම්බර් 31 දිනට අයවියයුතු හිඟ කුලිය රු.39,600 ක් විය.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

3.2.1 ව්‍යාපෘති ප්‍රමාදය.

(අ) 2014 වර්ෂයේදී කරන ලද විවිධ ව්‍යාපෘති වෙනුවෙන් මුදල් ප්‍රතිපූර්ණය නොවීම නිසා 2015 සභා කර්මාන්ත සඳහා වෙන් කරන ලද මුදලින් රු.13,408,200 ක මුදලක් දොරින් දොරට ගමින් ගමට ව්‍යාපෘතියේ කර්මාන්ත 24 ක් වෙනුවෙන් වැයකර තිබුණු අතර, 2016 පෙබරවාරි මාසය වන විටත් එම මුදල් ප්‍රතිපූර්ණය වී නොතිබුණි. 2015 මාර්තු 16 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ එල්ජී.ඩී/ජීඑම්/03 දරන ලිපිය මගින් රු.1,527,236 ක් වටිනා කර්මාන්ත දෙකක් පමණක් සභා අරමුදලින් ගෙවීමට අනුමත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රු.9,000,000 ක් වටිනා සහා කර්මාන්ත 37 ක් අනුමතවී තිබූ අතර, රු.6,525,000 ක් වටිනා කර්මාන්ත 25 ක් මුදල් ප්‍රතිපාදන නොමැතිවීම මත 2015 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ බස්නාහිර පළාත් උපමාන පාදක ප්‍රදාන යටතේ මාර්ග සංවර්ධන කටයුතු සඳහා ලැබී ඇති රු.4,165,000 ක් වටිනා ව්‍යාපෘති 14 ක් සභාවට ලැබී තිබුණි. එම ව්‍යාපෘති වැඩ ආරම්භ කළ දිනය හා අවසන් කර ඇති දිනය අනුව සංවර්ධන කටයුතු කිරීම සඳහා ගත වී ඇති කාලය දින දෙකේ සිට දින 11 දක්වා අඩු කාලයක් විය. ඒ අනුව මෙකී සංවර්ධන කටයුතු නියමිත ප්‍රමිතීන්ට අනුව සිදුකර තිබේද යන්න පිළිබඳ විගණනයේදී මතභේදයට ලක්විය.තාක්ෂණ නිලධාරීන්ගේ වාර්තා පදනම් කරගෙන මෙම ගෙවීම් කර තිබුණි.

(ඈ) සභාවට ලැබී තිබූ ව්‍යාපෘති 3 ක් අදාළ කාලය තුළ නිම කිරීමට අපොහොසත්වීම නිසා රු.2,000,000 ක ප්‍රතිපාදන සභාවට අහිමි වී තිබුණි. කාලය ප්‍රමාණවත් නොවීම නිසාත් එක් ව්‍යාපෘතියක භූමියේ අයිතිය පිළිබඳ ඇතිවූ ගැටළුව නිසාත් ව්‍යාපෘති ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වර්ග කිලෝ මීටර් 178.5 ක්වූ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාර්ග 468 ක් ලේඛනගත කර ඇතත්, කොන්ක්‍රීට්, බොරළු හා තාර වශයෙන් වර්ග කර හඳුනාගෙන සිතියම් ගතකර නොතිබුණු අතර, 2012 වර්ෂයෙන් පසු මාර්ග ලේඛනය යාවත් කාලීන කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් මහජන පුස්තකාල 4 යටතේ ග්‍රාමීය පුස්තකාල 10 ක් විය. සමීක්ෂණ වාර්තාවලට අනුව පැල්පිට ග්‍රාමීය පුස්තකාලය,යකඹේ ප්‍රජා ශාලාවේ අබලන්ව පවතින ගොඩනැගිල්ලක පවත්වාගෙන යාම නිසා බොහෝ පොත් තෙමී දිරාපත්වී තිබීම, පරිහරණය නොවන පොත් මාරු කිරීමට කටයුතු නොකිරීම, පුස්තකාල භාරකරුවන් කාර්ය බහුල බැවින් නිරන්තරයෙන් පුස්තකාලවල රැඳී නොසිටීම හා අවිධිමත් ලෙස බැහැරදීම් හා පොත් අස්ථානගත වීම් සිදුවී තිබීම යන අඩුපාඩු නිරීක්ෂණය විය.

(ඇ) 2013 ජූනි සිට දෙසැම්බර් දක්වාත් 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වාත් කාලයට අදාළ හිඟ හිටි දේපළ ණය පොලී මුදල පිළිවෙලින් රු.111,610 ක් හා රු.321,792 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.4 මානව සම්පත් කළමනාකරණය

2015 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | අතිරික්ත | පුරප්පාඩු |
|---|---|---|---|---|
| මාණ්ඩලික | 05 | 05 | - | - |
| ප්‍රාථමික | 142 | 147 | 05 | - |
| ද්විතියික | 52 | 51 | - | 01 |
| අනියම් හා ආදේශක | - | 01 | 01 | - |
| | 199 | 204 | 06 | 01 |

ප්‍රීමික්ස් ව්‍යාපෘතියට සේවකයින් යොදවා ගැනීම සඳහා 2015 ජනවාරි සිට නොවැම්බර් දක්වා මාසිකව සේවකයින් 8 ත් 11 ත් අතර ප්‍රමාණයක් සේවයේ යොදවා රු.1,232,300 ක මුදලක් ගෙවා තිබුණි. සේවකයින් බඳවා ගැනීම සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් සේවා කොන්දේසි හා රාජකාරි පිළිබඳ

විධිමත් පත්වීමේ ලිපියක් නිකුත් කිරීම, වැඩ පැවරීමේ ලිපියක් ලබා දීම සිදුකර නොතිබූ අතර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතියද ලබා ගෙන නොතිබුණි.

4.10 **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) මූල්‍ය පාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පාලනය